# Symphony Junior මෙල්බර්න් නුවරදී දොරට වඩියි



මෙල්බර්න් නුවර, හයිඩල්බර්ග්හි, බැනියුල් තියටර් හිදී, මාර්තු මස 15 වන සෙනසුරාදා හැන්දෑවේ ඉතාමත් කලාතුරකින් දැක ගන්නට ලැබෙනා විරල සංදර්ශනයකට සහභාගී වීමට අවස්ථාව ලැබුනි. එනම් අවුරුදු 13, 14, 15 වයස් කාණ්ඩයේ සිටිනා සිංහල දූ පුතුන් සත් දෙනෙකුගෙන් සමන්විත Symphony Junior සංගීත කණ්ඩායමේ කල එළි දැක්මයි.



මේ ප්‍රසංගයේ විශේෂත්වය වූයේ, මේ දරුවන් සත්දෙනාම ඕස්ට්‍රේලියාවේ ඉංග්‍රීසි බසින් අධ්‍යාපනය හදාරමින්, ඉංග්‍රීසි බස වැඩිපුර කතා කරන අතරේ, ඉතා පැහැදිලි සිංහල බසින් මියුරු සිංහල ගීත 14 කට පණ පෙවීමයි. මෙම දරුවන් සත් දෙනාගෙන් තිදෙනෙකුම මෙරට උපත ලැබූවන් වීමත්, ඉතිරි සිව් දෙනාම ඔවුන්ගේ කුඩා වියේදී මේ රටට පැමිණීමත් විශේෂයක් වනවා.

ප්‍රවීණ කීබෝඩ් වාදකයකු සහ උපදේශකවරයකු වන අසංක ගගහගෙදරගේ සංකල්පයක් අනුව, ඔහු විසින් නිර්මාණය කරන ලද "Symphony Keyboard Academy" යේ දැනට කීබෝඩ් වාදනය හදාරණ තිසල් විපුලගුණ, කවිඳු ලියනගේ, ඈෂ්ර් වෙත්තසිංහ, තුෂාන් ඉද්දමල්ගොඩ, චමින් ඒකනායක, රවිඳු වීරසිංහ සහ ඕෂධී ලෝගුස් යන දරුවන් සත් දෙනාගෙන් සමන්විත් වන මෙම සංගීත කණ්ඩායමේ නිර්මාතෘ වන්නේද පසුගිය වසරේ නොවැම්බර් මස කල එළි දුටු 'Symphony" සංගීත කණ්ඩායම මෙහෙයවන්නේ ද අසංකමයි. Symphony Junior" සංගීත කණ්ඩායමේ නායකත්වය, මෙම ප්‍රසංගයේදී තිසල් විපුලගුණ විසින් දරනු ලැබීය.



සුනිල් ශාන්ත, ගුණදාස කපුගේ, ක්ලැරන්ස් විජේවර්ධන, රූකාන්ත ගුණතිලක, කසුන් කල්හාර, රොඩ්නි වර්ණකුල, මේරියන්ස්, ශිහාන් මිහිරංග, ලහිරු පෙරේරා විසින් එදා මෙදා තුර ජනප්‍රිය, විවිධ ශෛලීන්ගෙන් යුතු ගීත 14 කින් ප්‍රසංගය සමන්විත වූ අතර, එම ගීත 14න් පසුව, Symphony කණ්ඩායමේ අසංග ගගහගෙදර, තිලිනි බමුණුආරච්චි, රුක්ෂාන් සකලසූරිය, ප්‍රවීන් ද මෙල් මියුරු ගීත් 4 කින් ප්‍රසංගය තවත් ඔපවත් කළහ.


ඡායාරූප සංජීව ලියනගේ

නතාෂා දේවගේ, මිනෝලි දේවගේ, භවනි ගුණවර්ධන යන දියණියන් තිදෙනා විසින් සරස්වතී පූජා නැටුම පවත්වා ප්‍රසංගය ආරම්භ කල අතර, නටාෂා සහ ෂෙහානා විජේසුන්දර දැරියෝ " සමනල රෑනක් සේ" ගීතයට ඉතා සිත්ගන්නා සුළු නර්තනයක් ඉදිරිපත් කළහ.



මෙම ප්‍රසංගය කී බෝඩ් ප්‍රධාන කොට ගනිමින්, ලීඩ්, රිදම් සහ බේස් ගිටාර් වාදනයෙන්, තබ්ලා වාදනයෙන්ද ඔපවත් වූයේ දරුවන්ගේ නිසඟ කුසලතාවයනට තෝතැන්නක් කරමින්.

අසංකගේ අරමුණ වී තිබුනේ මෙම දරුවන්ගේ සැඟවුනු කුසලතා එළිදැක්වීම බවත්, සිංහල සංස්කෘතිය ඉදිරියට ගෙනයාමට මෙම පරපුර නියෝජනය කරමින්, සංගීතය මගින් යමක් කිරීම බවත් ඔහු ප්‍රකාශ කල අතර, මෙම සියළු කර්තව්‍යයන් ඔහු විසින් නොමිලේ කරන ලද්දක් බවත් සඳහන් කිරීම වටී.

යමපෑ නගර සභාවේ නාගරික මන්ත්‍රී චන්ද්‍රා බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙනුත්, තවත් සම්භාවනීය ආරාධිතයන් කිහිපදෙනෙකු සහ ප්‍රේක්ෂකයින් 300 පමණ ඉදිරියේ මෙම ප්‍රසංගය පැවැත්වුනු අතර, නොමිලේ මෙය නැරඹීමේ අවස්ථාව සැමට උදාවිය.

ප්‍රසංගයේ නිවේදන කටයුතු ප්‍රවීණ මාධ්‍යවේදී සහ නිවේදක විජය කරුණාසේන මහතා විසින් සිදු කෙරින.

මෙම අවස්ථාව නොමිලේ ඉදිරිපත් කරන්නට හැකිවීම සඳහා නන් අයුරින් උදව් උපකාර කල සැමට තමන්ගේ ස්තූති ප්‍රණාමය පුද කරන බව අසංක ගගහගෙදර මහතා ප්‍රකාශ කළේය.








